# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1283 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 11/10/2023 පැය 1035

## මාධ්‍ය නිවේදනය

**01. වෙඩි තබා ඝාතනයකට අදාල සැකකරුවන් තිදෙනෙකු මෝටර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි අංශය.**

2023.09.17 වන දින මරදාන පොලිස් වසමේ මාලිගාකන්ද ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් සිදුකල වෙඩි තැබීමකින් ත්‍රිරෝද රථයකින් ගමන් කරමින් සිටි වාසල පාර, කොටහේන ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 36ක පුද්ගලයෙකු සහ වයස අවුරුදු 06 ක් වූ ඔහුගේ දැරිය තුවාල ලබා ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු දැරිය මියගොස් තිබුණි.

පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි අංශයේ නිලධාරීන් විසින් 2023.10.10 වන දින සවස් කාලයේ වැලිකඩ පොලිස් වසමේ ඔබේසේකරපුර ප්‍රදේශයේදී මෙම අපරාධය සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර ගිනි අවි ප්‍රවාහනය කිරීම හා සැකකරුවන් පලා යාම සඳහා යොදාගත් ව්‍යාජ අංක තහඩු සහිත මෝටර් රථයක් සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36, 61 හා 62 වයස්වල පසුවන රාජගිරිය හා ඉරක්කාමම් 09 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් හා නඩු භාණ්ඩ වැඩිදුර විමර්ශන සඳහා මරදාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමකට අදාලව අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - තණමල්විල පොලිස් ස්ථානය.**

2023.10.09 වන දින තණමල්විල පොලිස් ස්ථානයට වාර්තා වූ ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමට අදාලව තණමල්විල පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර එම අපරාධයට අදාලව අවශ්‍ය කර සිටි සැකකරුවෙකු තණමල්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර 2023.10.10 වන දින දහවල් කාලයේදී කුඩාඔය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වූ මානෙල්ගල, ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සොයා ගෙන ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හක්ක පටස් එකක් පෑඟීමෙන් දරුවෙකු තුවාල ලැබීම - අලදෙණිය පොලිස් ස්ථානය.**

2023.10.10 වන දින දහවල් කාලයේ අලදෙණිය පොලිස් ස්ථානයේ උල්ලඳුපිටිය මීමැසි උද්‍යානය අසල නිවසක පදිංචිව සිටි වයස අවුරුදු 15 ක පිරිමි ළමයෙකු නිවස අසල මාර්ගයේ තිබූ බෝලයක් වැනි යමක් දැක එය පෑඟීමේදී පුපුරා ගොස් ඔහුගේ දකුණු පාදයේ ඇඟිළි වලට තුවාල සිදු වී ඇත. එම අවස්ථාවේ දී රාජකාරි කටයුත්තක් සඳහා ගමන් කරමින් සිටි පොලිස් නිලධාරිණියක් විසින් තුවාල ලැබූ දරුවා

තිත්තපජ්ජල රජයේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට ඇතුලත් කර ඇත.

අනතුරුව පොලිස් නිලධාරීන් විසින් එම සිදුවීම සිදු වූ ස්ථානය අවට පරීක්ෂාවට ලක් කර ඇති අතර ඒ අසල තිබූ නිවසක් පරීක්ෂා කිරීමේදී මෙරට නිෂ්පාදිත හක්ක පටස් 09 ක් සමඟ මෙම නිවසේ කුලී පදනම මත පදිංචිව සිටි පුද්ගලයෙකු හා ඔහු සමඟ රැඳී සිටි තවත් අයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27 සහ 25 ක් වන කැලැනිකවැව, ගලෙන්බිඳුනුවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී සතුන් දඩයම් කිරීම සඳහා මෙම හක්ක පටස් නිෂ්පාදනය කර ඇති බවට අනාවරණය වී ඇති අතර අලදෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - සිවලාකුලම පොලිස් වසම.

2023.10.10 වන දින රාත්‍රී කාලයේ සිවලාකුලම පොලිස් වසමේ තම්මැන්නාගම දෙස සිට මයිලගස්වැව දෙසය ධාවනය වූ ට්‍රැක්ටර් රථයක් තම්මැන්නාගම වැව් බැම්මෙන් පහළට පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත.

අනතුරින් ට්‍රැක්ටර් රථයේ රියදුරු හා රථයේ දෙපස මඩකවරය මත ගමන් ගත් පුද්ගලයින් දෙදෙනා බරපතල තුවාල ලබා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ තම්මැන්නාගම, මයිලගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිවලාකුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**